**17-03-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ සත්‍ය පියාගෙන් සත්‍ය කතාපුවතට සවන් දී, සාමාන්‍ය මිනිසෙකුගෙන් නාරායන බවට පරිවර්ථනව වනවා. අසීමිත පියාගෙන් ඔබගේ උපත් 21 ක උරුමය ඔබට හිමි වනවා.

**ප්‍රශ්නය:** ඔය දරුවන් දිව්‍යමය බුද්ධි ඇති අය බවට පත්වන්නේ, පියාගේ කුමන නියෝග අනුගමනය කිරීමෙන්ද?

**පිළිතුර:** පියාගේ නියෝගය වන්නේ සියලුම ශාරීරික නෑදැයින් අමතක කර දමා, පියා සහ රාජධානිය සිහිපත් කරන්න. සත්ගුරුගෙන් ඔබට ලැබෙන මෙම ශ්‍රීමත්, ඔබට විමුක්තිය ලබාගැනීම පිණිසය. මෙම ශ්‍රීමත් පිළිපදින අය, එනම්, ජීවාත්ම අවධානයට පත්වන අය, දිව්‍යමය බුද්ධි ඇති අය වෙයි.

**ගීතය:** අද මිනිසුන් සිටින්නේ අන්ධකාරයේය.

ඕම් ශාන්ති. මෙය කලි යුග ලෝකයයි සියලු දෙනාම සිටින්නේ අඳුරේය. මෙම භාරතයම, ආලෝකයේ තිබුණි. මුලදී, භාරතය, දිව්‍ය ලෝකය වූ කල්හි, තමන් හින්දූන් ලෙස හඳුන්වාගන්නා මෙම මිනිසුන්, දේවතාවන්ව සිටියා. භාරතයේ ජනතාව, දිව්‍ය ලෝකයේ වාසය කළ කාලයේදී, වෙනත් ආගම් තිබුණේ නැත තිබුණේ එක් ධර්මයක් පමණයි. ස්වර්ගය, දිව්‍ය ලෝකය, වයිකුන්තය, බාහිස්ත් (සියල්ල දිව්‍ය ලෝකයේ නමය) යන සියල්ල භාරතයේ නම් විය. පෞරාණික භාරතය පිවිතුරු මෙන්ම බොහෝ සේ ධනවත්ව තිබුණි. දැන් භාරතය කලි යුගයේ ඇති බැවින් එය මුළුමනින්ම දුගී වී ඇත. එය ස්වර්ණමය යුගය විය. ඔබ සියලු දෙනා භාරතයේ වැසියන්ය. ඔබ දැන් අන්ධකාරයේ සිටින බවත් ඔබ දිව්‍ය ලෝකයේ සිටින විට, ආලෝකයේ සිටි බවත් ඔබ දන්නවා. දිව්‍ය ලෝකයේ රාජේෂ්වර (රජු) සහ රාජේෂ්වරී (රැජිණ) වූයේ ලක්ෂ්මි සහ නාරායනය. එයට සතුටේ දේශය යැයි කියයි. අළුතින් පැමිණෙන අය වෙනුවෙන් පියා නැවතත් විස්තර කරදෙයි. ඔබ දිව්‍ය ලෝකයේ උරුමය, පියාගෙන් හිමිකර ගත යුතු අතර මෙයට ජීවන-මුක්තිය යැයි කියයි. වර්තමානයේ සෑම කෙනෙක්ම සිටින්නේ ජීවන බන්දනයකයි. විශේෂයෙන් භාරතයත්, සාමාන්‍යයෙන් ලෝකයත්, රාවනගේ සිරගේහි, ශෝක පැල්පතේ ඇත. රාවන සිටියේ ලංකාවේ පමණක්වත්, රාමා සිටියේ භාරතයේවත්, රාවන පැමිණ සීතා පැහැර ගත්තේවත් නැත. ඒ සියල්ල ගොතන ලද බොරු කතාය. සියලුම ග්‍රන්ථයන්ගෙන් ප්‍රධානතම මැණික වන්නේ ගීතාවයි, එනම්, එය පවසන ලද්දේ පරමාත්ම දෙවියන් විසින්ය. මනුෂ්‍යයින්ට කිසිවෙකුට විමුක්තිය පිරිනැමිය නොහැක. ස්වර්ණමය යුගයේ ජීවන-මුක්තියේ සිටි දේවතාවන් විසූහ. ඔවුන්ට ඔවුනගේ උරුමය හිමිවූයේ කලි යුගයේ අවසානයේදී. භාරතයේ ජනතාව මෙය නොදන්නා අතර, මෙය කිසිම පත පොතක සඳහන් වීද නොමැත. සියලුම ග්‍රන්ථ තිබෙන්නේ භක්ති මාර්ගය සඳහාය. ඒ සියල්ල භක්ති මාර්ගය සඳහා දැනුමයි. විමුක්ති මාර්ගය වෙනුවෙන් මනුෂ්‍යයන්ට කිසිම දැනුමක් නැත. පියා පවසන්නේ මනුෂ්‍යයන්ට, මනුෂ්‍යයන් වෙනුවෙන් ගුරුන් විය නොහැක. කිසිම ගුරු කෙනෙකුට විමුක්තිය පිරිනැමිය නොහැක. ඒ ගුරුන් ඔබට කියන්නේ, භක්තියේ යෙදෙන්නට මෙන්ම දන් දී, පුණ්‍යකර්ම කරන්නට කියාය. තඹ යුගයේ සිටම භක්තිය පැවතී ඇත. ස්වර්ණමය සහ රිදී යුගයන්හිදී, දැනුමේ ප්‍රතිලාභය තිබෙයි. මෙම දැනුම එහිදීත් පැවතෙන්නේ නැත. භාරතය ලැබූ උරුමය, පියා විසින් දෙනු ලැබුවේ සංගම යුගයේදී වන අතර, ඔබට දැන් එය නැවතත් ලැබෙනවා. භාරතයේ ජනයා, අපායේ වැසියන්, විශාල වශයෙන් දුක අත්විදින විට, ඔවුන් පාරිශුද්ධකරු වන පියාට, දුක නැති කර සතුට පිරිනමන්නාට අඬ ගසයි. කාගේ දුකද? සෑම කෙනෙකුගේම, මන්ද විශේෂයෙන්ම භාරතයේත් සාමාන්‍යයෙන් ලෝකයේත් සෑම කෙනෙක් තුළම පාපයන් පහ තිබේ. පාරිශුද්ධකරු වන්නේ පරමාත්ම පියාය. ඔහු පවසන්නේ මම සෑම කල්පයකම සංගම යුගයේ පැමිණ, සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නා වන්නෙමි. මම අහිංසක සහ දුබල අයවත්, ගල් බුද්ධි ඇති අයවත්, ගුණදම් නොමැති මෙන්ම ගුරුන්වද ඉහළ නංවන්නෙමි, මන්ද මෙය අපවිත්‍ර ලෝකය බැවින්. ස්වර්ණමය යුගයට පිවිතුරු ලෝකය යැයි කියයි. භාරතයේ ලක්ෂ්මි සහ නාරායනගේ රාජධානිය තිබුණි. ඔවුන් ලෝකයේ අධිපතියන්ව සිටි බව, භාරතයේ ජනතාව නොදනී. අපවිත්‍ර දේශය යනු මුසාවේ දේශය වන අතර, පිවිතුරු දේශය යනු සත්‍ය දේශයයි. භාරතය පිවිතුරු දේශය විය. එය ලක්ෂ්මි සහ නාරායනගේ සූර්ය රජ පෙළපතේ රාජධානිය විය. මෙම භාරතය, කිසිදා විනාශ නොවන, අවිනාශී දේශයයි. එය ඔවුන්ගේ රාජධානිය වූ කල්හි,

වෙනත් භූමි නොවීය. ඒ සියල්ල මතු වූයේ පසුවයි. ග්‍රන්ථ වල ඇති විශාලතම වැරැද්ද වන්නේ, චක්‍රයේ කාල වකවානුව වසර සිය දහස් ගණනක් දීර්ඝ බව ලියැවී තිබීමයි. පියා පවසන්නේ, චක්‍රය, වසර සිය දහස් ගණනක් දීර්ඝ වන්නේවත්, ස්වර්ණමය යුගය වසර සිය දහස් ගණනක් දීර්ඝ වන්නේවත් නැත. චක්‍රයේ කාලය, වසර 5000 කි. ඉන්පසුව ඔවුන් පවසන්නේ මනුෂ්‍යයන් උපත් මිලියන 8.4 ක් ගන්නා බවයි. ඔවුන් මනුෂ්‍යයන්ව බලලුන්, බල්ලන් ආදීන් බවට පත්කර තිබේ. කෙසේවෙතත්, සත්වයන්ගේ උපත මුළුමනින්ම වෙනස්ය. මිලියන 8.4 ක විවිධ සත්ව විශේෂ ඇත. මනුෂ්‍යයන් එක් වර්ගයක් පමණක් සිටින අතර, ඔවුන් උපත් 84 ක් ගනී. පියා පවසන්නේ ඔය දරුවන් අයත් වූයේ ආදි සනාතන දෙව් දේවතා ධර්මයටයි. නාටකයේ සැලසුමට අනුව, භාරතයේ ජනතාවට ඔවුන්ගේ ධර්මය අමතක වී ඇත. කලි යුගයේ අවසානයේදී ඔවුන් මුළුමනින්ම අපවිත්‍ර වී ඇත. පියා පැමිණ සංගම යුගයෙදී ඔබව පිවිතුරු කරයි. මෙයට දුක් දේශය යැයි කියයි. ඉන්පසුව ඔබලාගේ චරිත කොටස් නැවත සතුටු දේශයේදී ආරම්භ වෙයි. පියා පවසන්නේ අහෝ දරුවනි, භාරතයේ ජනතාව වන ඔබලා, දිව්‍ය ලෝකයේ වැසියන් විය. ඉන්පසුව ඔබ උපත් 84 හි ඉනිමඟ දිගේ පහළට පැමිණියා. සතෝ තත්ත්වයේ සිට ඔබට නිසැකයෙන්ම රජෝ සහ තමෝ වීමට තිබුණා. ඔය දේවතාවන් තරම් ධනවත්, සදා සතුටින් පිරි සහ සදා නිරෝගී විය හැකි වෙනත් කිසිවෙකු නොමැත. භාරතය බොහෝ ධනවත්ව පැවතුණි! දියමන්ති සහ මැණික්, විශාල ගල් මෙන් විය. ඉන් බොහොමයක් කැබලි කරන ලදී. ඔහු ඔබව එතරම් ධනවත් කළ අන්දම ගැන පියා ඔය දරුවන්ට සිහි ගන්වයි. ඔබ දිව්‍යමය කලා 16 කින් පිරුණු එමෙන්ම සියලු ගුණදම් වලින් පිරිපුන්ව සිටියා. රජ සහ රැජිණ කෙබඳුද, පුරවැසියන්ද එබඳුම විය. ඔවුන්ට දේවතාවන් සහ දෙවගනන් කියාද කිව හැක. කෙසේවෙතත්, සිටින්නේ එක් දෙවි කෙනෙක් පමණක් බවත් ඔහු පියා බවත් පරමාත්ම පියා විස්තර කර දී තිබේ. ඔහුට ඊශ්වර හෝ ප්‍රභූ කියා ඇමතීමෙන්, ඔහු සියලුම ජීවාත්මයන්ගේ පියා බව ඔබට මතක් වන්නේ නැත. එම කෙනා අසීමිත පියාය. භාරතයේ ජනතාව, ශිවාගේ ජන්ම දිනය සමරන නමුත් ඔහු සැබවින්ම පැමිණියේ කවදාද කියා, කිසි කෙනෙක් නොදන්නා බව, ඔහු විස්තර කරයි. ඔවුන් ගල් බුද්ධි ඇති කලි යුගී අයයි. ඔවුන් දිව්‍යත්වයේ ස්වාමිවරුන්ව සිටි අතර දැන් ගල් ස්වාමිවරුන් වී සිටියි! ඔවුන්ට ස්වාමිවරුන් කියා හෝ කිව නොහැක, මන්ද ඔවුන් රජවරුන් හෝ රැජිණියන් නොවන බැවින්. ආරම්භයේදී මෙය දිව්‍යමය රජවරුන්ගේ භූමිය වන අතර පසුව එය රකුසු රාජධානිය වෙයි. මෙය නාට්‍යයක්. ඒවා සීමිත නාට්‍ය වන අතර මෙය අසීමිත නාටකයයි. මුල සිට අග දක්වා ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය ගැන ඔබ දැනුවත් වන්නේ මේ කාලයේදීය වෙනත් කිසිවෙකු එය නොදනී. භාරතයේ දේවතාවන් වාසය කළ විට, ඔවුන් මුළු ලෝකයේම අධිපතියන් විය. ඔවුන් පැවතුණේ භාරතයේ පමණයි. පියා ඔය භාරතයේ ජනයාට මතක් කර දෙයි. ස්වර්ණමය යුගයෙදී, ආදි සනාතන දේවතාවන්ට ශ්‍රේෂ්ඨ ධර්මයක් තිබූ අතර ඔවුන් සිදු කළේ ශ්‍රේෂ්ඨ ක්‍රියාය. ඉන්පසුව ඔවුන්ට උපත් 84 ක් තුළින් පහළට පැමිණීමට සිදු වුණා. එය දැන් ඔබගේ බොහෝ උපත් වල අවසානය වන්නේ කෙසේද යන කතාපුවත, පියා මෙතැන අසුන් ගෙන ඔබට කියා දෙයි. මෙය, එක්කෙනෙක් පමණක් ගැන ප්‍රශ්නයක් නොවෙයි. සටන් බිමක්ද නැත. එය ඔවුන්ගේ (ලක්ෂ්මි සහ නාරායන) රාජධානිය වූ බව, භාරතයේ ජනතාවට අමතකව ගොසින්ය. ස්වර්ණමය යුගයට දීර්ඝ කාල වකවානුවක් ලබා දීමෙන්, ඔවුන් එය බොහෝ ඈතට ගෙන ගොස් තිබේ. කිසිම මනුෂ්‍යයෙකුට දෙවියන් විය නොහැකි බව, පරම පියා පහදා දෙයි. මනුෂ්‍යයන්ට, තවත් මනුෂ්‍යයන්ට විමුක්තිය ලබා දිය නොහැක. සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නා, අපවිත්‍ර අය, පිවිතුරු කරවන්නා එක්කෙනෙක් බව කියැවෙයි. මෙය බොරුවේ දේශයයි. සත්‍ය දේශය ස්ථාපිත කරන ඒකායන කෙනා, සත්‍ය බාබාය. බැතිමතුන් වැඳ වැටෙමින් ඉඳ ඇති නමුත්, ඔවුන් භක්ති මාර්ගයේ වන්දනා කරන එකදු කෙනෙකුගේ හෝ චරිත කතාව ඔවුන් නොදනී. ඔවුන් ශිවාගේ ජන්ම දිනය පවා සමරයි. පරම පියා, නව ලෝකයේ නිර්මාණකරුයි ඔහු ඔබට අසීමිත සතුට ලබා දෙන, දිව්‍යමය දෙව් පියාණන්ය. ස්වර්ණමය යුගයේ සතුට තිබුණි. එය ස්ථාපිත වූයේ කෙසේද, එමෙන්ම කවුරුන් විසින්ද? ඔහු අපායේ වැසියන්ව, දෙව්ලොව වැසියන් බවට, දූෂිත අයව ශ්‍රේෂ්ඨ දේවතාවන් බවට පත් කළේය. මෙම වගකීම තිබෙන්නේ පියාටම පමණයි. මම ඔය දරුවන්ව පාරිශුද්ධත්වයට පත් කරනවා. ඔබ දිව්‍ය ලෝකයේ පාලකයන් වනවා. ඉන්පසුව ඔබව අපවිත්‍ර කරවන්නේ කවුරුන්ද? එම රාවනයි! සතුට මෙන්ම දුක ලබා දෙන්නේ දෙවියන් බව, මනුෂ්‍යයන් පවසයි. පියා පවසන්නේ මම සෑම කෙනෙකුටම සතුට ලබා දෙන්නෙමි. ඉන්පසුව කල්පයෙන් භාගයකට, ඔබ පියාව සිහි නොකරයි. පසුව රාවනගේ රාජධානිය ආරම්භ වන විට, ඔබ සෑම කෙනෙක්වම වන්දනා කිරීමට පටන් ගනී. මෙය ඔබගේ බොහෝ උපත් ගණනාවක අවසන් උපතයි. ඔබ විමසන්නේ බාබා, මා උපත් කීයක් ගෙන තිබෙනවාද? පියා පවසන්නේ ඔය දරුවන් ඔබගේම උපත් නොදනී. ඔබ සම්පූර්ණ උපත් 84 ම ගෙන ඇත. ඔබ ඔබගේ උපත් 21 ක උරුමය හිමි කරගැනීමට පැමිණ සිටියි, එනම්, ඔබගේ සත්‍ය බාබා පවසන, සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන්

නාරායන බවට පත් වීමේ සත්‍ය කතාපුවතේ මෙම දැනුමට ඔබ සවන් දෙයි. මෙය දැනුම වන අතර එය භක්තියයි. මෙම ආධ්‍යාත්මික ඥානය පැමිණ ඔබට ලබා දෙන්නේ, පරමාත්මය පමණයි. දරුවනි, ජීවාත්ම අවධානයට පත් වන්න! තමන් ජීවාත්ම බව සලකා, නිරතුරුවම පරමාත්ම පියාව පමණක් සිහිපත් කරන්න! ශිව බාබා, සියලුම ජීවාත්මයන්ගේ පියාය. සියලුම ජීවාත්ම පරම දනව්වෙන් පැමිණ, සිරුරු තුළට ඇතුළු වී, ඔවුන්ගේ චරිත කොටස් රඟදක්වයි. මෙයට කර්ම ෙක්ෂත්‍රය යැයි කියයි. මෙය ඉතා වැදගත් නාට්‍යයකි. ජීවාත්මයන්ට හොඳ හෝ නරක මනුෂ්‍ය උපතක් ලැබෙන්නේ ඔවුන්ගේ හොඳ හෝ නරක සංස්කාර වලට අනුවයි. පිවිතුරුව සිටි මෙම කෙනා දැන් අපවිත්‍ර වී ඇති අතර එයම ඔබටත් බලපායි. ඔබගේ පියා වන මා, රාවනගේ මෙම විදේශයේ අපවිත්‍ර සිරුරක් තුළට පැමිණිය යුතුයි. අංක එක හිමි කරගන්නා කෙනාගේ සිරුර තුළට මා ඇතුළු විය යුතුයි. සම්පූර්ණ උපත් 84 ම ගන්නේ, සූර්ය රජ පෙළපතේ අය පමණයි. මෙම කෙනා බ්‍රහ්ම වන අතර ඔබලා බ්‍රාහ්මණයන්ය. පියා සෑම දිනකම මෙය විස්තර කරයි. කෙසේවෙතත්, ගල් බුද්ධි ඇති අයව දිව්‍යමය බුද්ධි ඇති අය බවට පරිවර්ථනය කිරීම, ඔබගේ නැන්දම්මාගේ ගෙදර යනවා වගේ නොවෙයි. අහෝ ජීවයනි, දැන් ජීව අවධානයට පත්වන්න! අහෝ ජීවයනි, දැන් ඒකායන පියාව සහ රාජධානිය සිහි කරන්න! ශරීරයේ නැදෑයින් අත්හරින්න, එවිට ඔබ දිව්‍යමය බුද්ධි ඇති අය බවට පත්වෙයි. සෑම කෙනෙක්ම මිය යා යුතුයි. එය දැන් සෑම කෙනෙකුගේම විශ්‍රාමික ස්ථිතියයි. ඒකායන සත්ගුරු හැරෙන්නට, වෙනත් කිසිවෙකුට සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නා විය නොහැක. පියා පවසන්නේ අහෝ භාරතයේ දරුවනි, මුලදි ඔබලා දිව්‍යමය බුද්ධි තිබුණු අයයි. ජීවාත්ම සහ උත්තරීතර ජීවාත්මය, බොහෝ කාලයක් වෙන්ව සිටි බව සිහිකර තිබේ. එබැවින් පළමුවෙන්ම, දේවතා ධර්මයට අයත්ව සිටි, භාරතයේ ජනයා වන ඔබලා පැමිණියා. අන් ආගම් වලට අයත් අය පසුව පැමිණි අතර එබැවින් ඔවුන් අඩු උපත් සංඛ්‍යාවක් ගනී. ලෝකයේ වෘක්ෂය වෙඩන්නේ කෙසේද කියා, පියා මෙතැන අසුන් ගෙන විස්තර කරයි. එය ධාරණය කරගැනීමට හැකි අයට මෙය ඉතා පහසුයි. සෑම දෙයක්ම ධාරණය කරගන්නේ ජීවාත්මයයි. පුණ්‍ය ආත්මයක් හෝ පාප ආත්මයක් වන්නේ ජීවාත්මයයි. මෙය ඔබගේ අවසන් උපතයි, ඔබගේ 84 වන උපතයි. ඔබ දැන් විශ්‍රාමික ස්ථිතියේ සිටියි. මන්ත්‍රයක් ලබා ගැනීම සඳහා, විශ්‍රාමික ස්ථිතියේ අය, ගුරු කෙනෙක් හදාගනී. ඔබ තව දුරටත් පිටස්තර මිනිසුන්ව ඔබගේ ගුරු කරගන්නේ නැත. මා ඔබ සෑම කෙනෙකුටම පියා, ගුරුවරයා මෙන්ම සත්ගුරුය. මට පාරිශුද්ධකරු, ශිව බාබා යැයි කියයි. ඔබට දැන් මතක් වී ඇත. ඔහු සියලුම ජීවාත්මයන්ගේ පියාය. ඔවුන් අමරණීය බැවින්, ජීවාත්ම, සත්‍යයි එමෙන්ම ජීවමානයි. සියලුම ජීවාත්ම තුළ, චරිත කොටසක් පටිගත වී තිබේ. පියාද සත්‍යය මෙන්ම ජීවමාන ජීවාත්මයයි. ඔහු මනුෂ්‍ය ලෝක වෘක්ෂයේ බීජය බැවින්, ඔහු පවසන්නේ මා මුළු ගසේම ආරම්භය, මධ්‍යය සහ අවසානය දන්නවා. මට දැනුමින් පිරුණු කෙනා කියා පවසන්නේ මේ නිසාය. බීජයෙන් වෘක්ෂය මතුවන්නේ කෙසේද, යන සියලු දැනුම ඔබ තුළද ඇත. වෘක්ෂය වැඩීමට කාලයක් ගත වෙයි. පියා පවසන්නේ බීජය මමයි. අවසානයේ මුළු වෘක්ෂයම සම්පූර්ණ දිරාපත් වුණු තත්ත්වයකට පත්වෙයි. බලන්න, දේවතා අත්තිවාරම තව දුරටත් නොපවතී එය අතුරුදහන් වී ඇත. පියා පැමිණිය යුත්තේ, දේවතා ධර්මය අතුරුදහන් වූ විටය. ඔහු ඒකායන ධර්මය ස්ථාපිත කර, අන් සියලුම ආගම් විනාශ කරවයි. පියා, ප්‍රජාපිතා බ්‍රහ්මගේ මාර්ගයෙන්, ආදි සනාතන දෙවි දේවතා ධර්මයේ ස්ථාපනය සිදු කරනවා. ඔබ දූෂිත මනුෂ්‍යයන්ගෙන්, උතුම් දේවතාවන් බවට පත්වීම සඳහා මෙහි පැමිණ සිටියි. මෙම නාටකය පෙර නියම වී ඇති අතර එයට අවසානයක් නැත. පරමාත්ම පියා පැමිණෙනවා. සියලුම ජීවාත්ම සහෝදරයන්ය, අශාරීරික ලෝකයේ වාසය කරන්නන්ය. සෑම කෙනෙක්ම සිහි කරන්නේ එම ඒකායන පියාවයි. සෑම කෙනෙක්ම දුක ඇති කල, ඔහුව සිහි කරයි. රාවනගේ රාජධානියේ දුක තිබේ. මෙහි, සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නා, පියා, එක්කෙනෙක් බව, සෑම කෙනෙක්ම සිහි කරයි. ඔහුව ප්‍රශංසා කෙරෙයි. පියා නොපැමිණියේ නම්, ඔබව පිවිතුරු කරන්නේ කවුද? මෙකල, ක්‍රිස්තියානුවන්, බෞද්ධයින් ආදිය ඇතුළුව, සියලුම මනුෂ්‍යයන් තමෝප්‍රධාන්ය. සෑම කෙනෙක්ම අනිවාර්යෙන්ම පුනර්භව ගත යුතුයි. දැන් සෑම කෙනෙක්ම පුනර්භව ගන්නේ අපායේය. හින්දු ආගමේ මිනිසුන් කියන පරිදි, ඔවුන් සතුට වෙතට නොයයි කෙනෙක් මිය ගිය විට, ඔහු දිව්‍ය ලෝකයේ වැසියෙක් වන්නේ නම්, ඉන් කියැවෙන්නේ ඔහු අපායේ සිටි බවයි. එබැවින් ඔබගේ මුවේ රෝස මලක් පිපේවා! (ඔහු දිව්‍ය ලෝකයට ගිය බව, සැබෑවක් වේවා!) ඔහු දිව්‍ය ලෝකයට ගොස් ඇති බැවින්, ඔබ ඔහුට අපායේ අපවිත්‍ර ආහාර කවන්නේ ඇයි? මිනිසුන් වෙන්ව ගිය ආත්ම වලට ආහාර කවයි. බෙංගාලයේ ඔවුන් මාළු සහ බිත්තර ආදිය පවා ඔවුන්ට කවයි. ඔවුන්ට එම ආහාර කෑමට ඇති අවශ්‍යතාවය කුමක්ද? කිසිම කෙනෙකුට තවම ආපසු නිවසට යා නොහැක. අංක එකේ ජීවය පවා උපත් 84 ක් ගත යුතුයි. මෙම දැනුමේ අපහසුතාවයක් නැත. භක්ති මාර්ගයේ බොහෝ උත්සාහ දැරීමට සිදුවෙයි. රාමාගේ නාමය මැතිරීමෙන් ඔවුන්ගේ ඇඟේ හිරිගඩු පිපෙයි. ඒ සෑම දෙයක්ම භක්ති මාර්ගයයි. ඉර,

සඳ ආදිය ආලෝකය ගෙනෙයි ඒවා දේවතාවන් නොවෙයි. ඇත්ත වශයෙන්ම දැනුමේ සූර්යයා, දැනුමේ චන්ද්‍රයා සහ දැනුමේ තාරකා යන ප්‍රශංසාවෙන් හැඳින්වෙන්නේ මෙකල ගැනයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වූණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගේ මෙම අවසන් සහ 84 වන උපතේදී, කිසිම පාපකාරී ක්‍රියාවක් සිදු නොකරන්න. පුණ්‍යාත්මයක් වීමට උපරිම උත්සාහ දරන්න. මුළුමනින්ම පාරිශුද්ධ වන්න.
2. ඔබගේ බුද්ධිය දිව්‍යමය කරගැනීම සඳහා, සියලුම ශාරීරික නෑදෑයින් අමතක කර දමා, ජීව අවධානයෙන් සිටීම පුහුණු වන්න.

**වරදානය:** ඔබ නිරන්තරයෙන් බලයෙන් පිරී ඉතිරී ගොස් ඔබේ පැරණි සංස්කාර සහ බාධක වලින් නිදහස් වේවා.

ඔබට ඕනෑම ආකාරයක බාධකයකින්, දූර්වලතාවයකින් හෝ පැරණි සංස්කාරයකින් නිදහස් වීමට අවශ්‍ය නම්, බලය උකහා ගන්න, එනම්, සියලු ආභරණ පැළඳ සිටින ඔබේ ස්වරූපය අනුගමනය කරන්න. සියලු ආභරණවලින් නිරන්තරයෙන් අලංකාරව සිටින අය අනාගතයේදී විෂ්ණු රාජවංශයේ කොටසක් බවට පත්වන අතර, ඔවුන් වර්තමානයේ වෛෂ්ණවයන් බවට පත්වන බැවින්, කිසිදු තමෝගුණී සිතුවිල්ලකට හෝ සංස්කාරයකට ඔවුන්ව ස්පර්ශ කළ නොහැක. ඔවුන් මෙම පැරණි ලෝකයෙන්, එනම්, මේ ලෝකයේ ඕනෑම දෙයකින් හෝ පුද්ගලයෙකුගෙන් පහසුවෙන් ඉවත් වේ. කිසිවෙකුට කිසිදු හේතුවක් නිසා ඔවුන්ව ස්පර්ශ කළ නොහැක.

**පාඨය:** ඔබ කරන සෑම ක්‍රියාවකදීම, සෑම මොහොතකම සමබරතාවයක් පවත්වා ගැනීම සෑම කෙනෙකුගේම ආශිර්වාදය ලබා ගැනීමේ මාර්ගයයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

යමෙකු මිතුරන් දෙදෙනෙකුගෙන් එක් අයෙකුට අපහාස කරන විට, අනෙක් මිතුරා ඔහුගේ ආකල්පය සම්පූර්ණයෙන්ම පරිවර්තනය කරයි. ශ්‍රද්ධා විශ්වාසය ඇති තැන, වචන වල අර්ථය වෙනස් කළ හැකි අතර තත්වය කුඩා කළ හැකිය. ඉතින්, එක් එක් අයගේ විශේෂතා බලන්න, ඔබ බොහෝ දෙනෙක් වුවද, ඔබ සියල්ලන්ම එක්සත් වී සිටින බව පෙනෙනු ඇත. මුළු සභාවම එක් දිශාවකට එක්සත් වනු ඇත. යමෙකු වෙනත් කෙනෙකු ගැන අපහාසාත්මක දෙයක් ඔබට පැවසූ විට, ඔහුට සහාය දීම වෙනුවට, එය පවසන අයගේ ආකල්පය පරිවර්තනය කරන්න.